"…. ඔහු නිර්මාණය කරන ලද සතුන් එකිනෙකාට දයාව කරුණාව දක්වමින් සිටින්නේය. ඒ කෙතරම්දයත් වෙළඹ පවා තම කුඩා දරු පැටවා නොපෑගී සිටනු වස් තම පා කුර ඔසවා ගන්නේය"….

පරම දයාබර මැවුම්කරුවා සෑම නිර්මාණයක්ම හොඳින් රැක බලා ගැනීමට වග බලා ගන්නේය. ගැඹුරු මුහුදු පත්ලේ සිටින මත්සයාගේ පටන් මහ පොළොවේ වෙසෙන කෘමියාටද, අහසේ පියාඹන පක්ෂීන්ටද, ආහාර පාන ලබා දී පෝෂණය කරන්නේය.

## දෙවියන්වහන්සේ අප කෙරෙහි දක්වන දයාව වැඩි කර ගන්නේ කෙසේද?

"නියත වශයෙන්ම (අල්ලාහ්) දෙවියන්වහන්සේගේ දයාව, දැහැමි ක්‍රියාවන් කරන්නන් හට ඉතාමත් සමීපයෙන් ඇත්තේය" (අල්-කුර්ආනය 7:56)

දෙවියන්වහන්සේ, අප අතින් සිදුවන වැරදි වලට සමාව ලබාදෙන්නේ පහත සඳහන් වදනෙහි සඳහන්ව ඇති නියමිත ඔවදන් පිලිපදින අයට බව කුර්ආනයේ සඳහන් වේ.

"තවද සත්තකින්ම කවුරුන් හෝ මා කෙරෙහි විශ්වාසය තබා (මගේ විවෘතභාවයට කැළලක් නොවන සේ සමානයන් නොතබා මා පමණක් නමදිමින්) තමන්ගේ පාපයන්ට පසුතැවිලි වී දැහැමි ක්‍රියාවන් කරමින් එහි ස්ථාවරව සිටින්නේද, නියත වශයෙන්ම ඔහුගේ පාපයන්ට සමාව දෙන්නෙමි" (අල්-කුර්ආනය 20:82)

නිවැරදි දේව විශ්වාසයෙහි තවත් වැදගත් අංගයක් වන්නේ දෙවියන්වහන්සේගේ අවසාන වක්තෘවරයාණන් වන මුහම්මද් නබි තුමාණන්ව විශ්වාස කර, ඔහුට අවනත වීමයි.

කෙටියෙන් පවසනවා නම්, දෙවියන්වහන්සේගේ දයාව කරුණාව වැඩියෙන්ම අත් කර ගන්නා අය කවුරුන්දයත්, දෙවියන්වහන්සේගෙන් ලැබුණු ආශිර්වාදයන් හා වරප්‍රසාදයන් අගය කරමින්, දෙවියන්වහන්සේ විසින් ලබා දෙන ලද ධනය දුප්පතුන් අතරේ බෙදාදෙමින්, අසරණයන්ගේ අවශ්‍යතාවයන් සපුරාලමින්, අනාථයින්ට පිහිට වී, ඔවුන්ට හොඳ වදනින් සංග්‍රහ කරමින්, ගෞරවාන්විත කටයුතු දෙවියන්වහන්සේ උදෙසා ඉටු කරන්නායි.
නබිතුමාණන් මෙසේ පැවසූහ: "කවුරුන් මිනිසා කෙරෙහි කරුණාව දක්වන්නේද, ඔවුන්ට දෙවියන්වහන්සේද දයාව කරුණාව දක්වන්නේය. මහ පොළොව මත සිටින්නන්ට කරුණාව දක්වනු! එවිට ඔබට අහස මත සිටින්නාද දයාව කරුණාව දක්වනු ඇත".

දෙවියන්වහන්සේගේ දයාව කරුණාව ලබා ගැනීමට හැකි මාර්ගයන් කිහිපයක් පහත දැක්වේ:

- "අල්ලාහ්ටද ඔහුගේ දූතයාටද අවනත වනු. එවිට ඔබට ඔහුගේ දයාව කරුණාව අත් කර ගත හැකි වනු ඇත".(අල්-කුර්ආනය 3:132)
- කුර්ආනයේ ඉගැන්වීම් අනුගමනය කිරීම මගින් එහි සඳහන් සාධාරණත්වය හා දයාව දැක ගත හැකිය
 "තවද අපි ආශීර්වාද ලත් මෙම ග්‍රන්ථය ඔබට පහළ කර ඇත්තෙමු. එබැවින් එය අනුගමනය කර ඔබව (නපුරෙන්) ආරක්ෂා කර ගනු. එමගින් ඔබට දයාව පහළ වනු ඇත". (අල්-කුර්ආනය 6:155)

v1.02

- "දෙවියන්ගේ දූතයාණන්ට අවනත වී නොකඩවා සලාතය ඉටු කර අනිවාර්‍යයිය වූ දානමානය (සකාතය අවශ්‍යතාවයෙන් පෙළෙන්නන්ට) දෙනු. එමගින් ඔහුගේ දයාව කරුණාව පහළ වනු ඇත".(අල්-කුර්ආනය 24:56)
- අවංකවම දෙවියන්වහන්සේගේ දයාව යැදීම,
 "අපගේ දෙවියනේ! ඔබ අපට ඍජු මාර්ගය පෙන්වා දී තිබියදී අපගේ හෘදයන් නොමග යාමට පත් නොකරනු. නියත වශයෙන්ම ඔබ ඉමහත් ධානපතියාය. එබැවින් ඔබ අපට දයාව පහළ කරනු මැනව!" (යයි ඉල්ලා සිටිනු). (අල්-කුර්ආනය 3:8)

## දයාව හා වගකීම

එක් පැත්තකින් බලන කල දෙවියන්වහන්සේගේ දයාවද, සාධාරණත්වයද ඔහුගේ ගුණාංගයන් තුළ ගැබ්ව ඇත. දෙවියන්වහන්සේ පරම දයාලුය.

"ඇත්තෙන්ම දැහැමියන්ට දෙවියන් වහන්සේගේ සන්නිධානයෙහි අතිශය සතුටින් පිරි උයන් වතු ලැබෙන්නේය. එවිට අප කෙරෙහි විශ්වාසය නොතැබූවන්ට සලකන්නා සේ අපි විශ්වාසය තැබූවන්ට සලකන්නෙමුද? ඔබට කුමක් නම් සිදු වී ඇත්තේද? ඔබ මේවා කෙසේ විනිශ්චය කරන්නෙහුද?" (අල්-කුර්ආනය 68:34-36)

කෙසේ වෙතත් දෙවියන්වහන්සේ කෙනෙකුගේ ක්‍රියාකලාපය පිළිබඳව තීරණය ගැනීමෙහිලා ඉතා වේගවත්ය. කෙනෙකු තමන්ගේ පාපයන්ට පසුතැවිලි වී නැතහොත් එම පාපයන් නැවතත් නොකරන බවට ස්ථිර අධිෂ්ඨාණයක් නොකර, එකම පාපයන් නැවත නැවතත් නොකඩවා කිරීම මගින් දෙවියන්වහන්සේව රැවැට්ටීමට සිතීම අනුවන ක්‍රියාවකි.

"තවද කවුරුන් හෝ තමන්ගේ මරණය දක්වා නොකඩවා නපුරු ක්‍රියාවන් කරමින් සිටල මරණය ළඟා වූ විට 'දැන් මා පසුතැවිල් වන්නෙමි' යයි පැවසීමෙන් හෝ දේව ප්‍රතික්ෂේපකයන් වශයෙන් මරණයට පත් වීම මගින් හෝ ඔවුන්ට කිසිම ප්‍රයෝජනයක් හෝ සමාවක් හෝ ලැබෙන්නේ නැත" (අල්-කුර්ආනය 4:18)

මුස්ලිම්වරුන්ට ඔවුන් කරන පාපයන් අවධාරණය කර එය වළක්වා ඒ වෙනුවට ඔවුන්ගේ දැහැමි ක්‍රියාවන්ට ඔවුන්ව දිරිමත් කරනු ලබයි. එවිට ඔවුන් පාපයන් කරන විට ඔවුන් අවංකවම පසුතැවිලි වී එයට දෙවියන්වහන්සේගේ පව් සමාව ලැබෙනු ඇතැයි අපේක්ෂාවෙන් සිටියි. තවද අවසානයේදී ඔවුන් ඔවුන්ගේ මැවුම්කරුවාගේ ඔවදන්වලට සවන් දී තෘප්තියට පත්ව එය ඔවුන්ගේ හදවතට සමීප කර තබා ගනී.

"සත්තකින්ම අල්ලාහ් (දෙවියන්වහන්සේ) ඉතාමත් ආදරවන්තව හා මිනිසුන් හට සද අනුකම්පා සහගතව සිටින්නේය". (අල්-කුර්ආනය 22:65)

More Information

p (+61) 3 9354-7500 w iisna.com/pamphlets e shareislam@gmail.com

Donation De tail s (Every $1 AUD donated produces 15 pamphlets)

Bank Name Commonwe alth Bank Account Pamphlet Project Australia
BSB 063620 Account 10532332 Swift (international) CTBAAU2S

# පරම දයාබර අල්ලාහ් (දෙවියන්වහන්සේ)



learn the basics

www.iisna.com/pamphlets

## “ඔබගේ දෙවියන්වහන්සේගේ දයාව අසීමිතයි”
## (අල්-කුර්ආනය 6:147)

සර්වබලධාරී දෙවියන්වහන්සේ (අල්ලාහ්) ඔහුගේ නිර්මාණයන් හට අසීමිත ලෙස ආදරය හා කරුණාව දක්වයිග මෙලොව හා පරලොවදී අපට ලබා දෙන සියලු ආශීර්වාදයන් හා යහපත මගින් ඔහුගේ අසීමිත දයාව ගැන පැහැදිලි සාක්ෂි දරයි. අපගේම මව්වරුන්ට වඩා දෙවියන්වහන්සේ අප කෙරෙහි දයාව කරුණාව දක්වන බව ඉස්ලාමය උගන්වයි. දෙවියන්වහන්සේගේ ගුණාංගයන් තුළින් මේ බව සනාථ වේ.

- සමාව යැදීම බාරගනු ලබන්නා
- අනුකම්පාසහගතබව
- ස්නේහවන්තබව
- ඉවසීම ඇත්තා
- මහා කාරුණිකබව
- පරම දයාබරයා
- සත්පුරුෂභාවය
- ඉමහත් ත්‍යාගශීලීබාවය
- ප්‍රදානය කරන්නා

මෙම ගුණාංගයන් මගින් දෙවියන්වහන්සේගේ දයාව කරුණාව හා ත්‍යාගශීලීභාවය විදහා දක්වන අතර ඔහු නිර්මාණයන් වෙත දක්වන ආශීර්වාදයන් මගින් ඔහුගේ ඉමහත් දයාව කරුණාවේ ශ්‍රේෂ්ඨත්වයට සාක්ෂි දරයි. තම නිර්මාණයන්ට දෙවියන්වහන්සේ මෙසේ ආමන්ත්‍රණය කරමින්
“ඕ ආදම්ගේ පුතුනේ! මහ පොළොව තරම් විශාල ලෙස ඔබට පව් ක්ෂමාව ලබා දිය හැකි මට, හවුල්කාරයෙකු ආරෝපනය කර අති විශාල පාපයන් සමග මා වෙතට පැමිණ මට කෙසේ මුහුණ දෙන්නෙහිද?”යි පවසයි.

## දෙවියන්වහන්සේගේ දයාබරත්වයේ හා ආශිර්වාදයන්හි මහිමය

“එසේ නම් ඔබ දෙවියන්ගේ ආශීර්වාදයන්ගෙන් කුමක් නම් ප්‍රතික්ෂේප කරන්නෙහුද?”
(අල්-කුර්ආනය 55:13)

දෙවියන්වහන්සේගේ ආශීර්වාදයන් අප සැමට නොකඩවා ලබා දී තිබේ. නොයෙකුත් දේ අතුරින් හොඳ සෞඛ්‍යය සම්පන්න බව , පෙනීම, ඇසීම, ආහාර පාන, පිරිසිදු වාතය, දරු සම්පත වැනි තවත් අප්‍රමාණ දෑ වේ. ඇතැමුන් දෙවියන්වහන්සේ විසින් ලබා දෙන ලද බුද්ධිය නමැති සම්පත උපයෝගී කර ගනිමින් ඔවුන්ගේ ජීවිකාව කරගෙන යාමට අවශ්‍ය සියලු සැප සම්පත් ප්‍රයෝජනයට ගනිමින් සම්පූර්ණයෙන්ම දෙවියන්වහන්සේට අවනත වී ක්‍රියාකරයි.
නමුත් ඇතැම් පිරිස් දෙවියන්වහන්සේ විසින් ලබා දෙන වරප්‍රසාදයන් හුක්ති විඳිමින් එහෙත් එය අගය නොකරමින්, දෙවියන්වහන්සේව ප්‍රතික්ෂේප කරයි. එනමුත් ඔවුනට ලබා දෙන සියලු වරප්‍රසාදයන්හි කිසිදු අඩුවක් නොකරයි. මදක් සිතාබලන්න,

දෙවියන්වහන්සේගේ කරුණාව දයාව ඔවුන් කෙරෙහි නොතිබුණේ නම් අද දින ඔවුන් ජීවත් වෙයිද?

සියලු දෙනාටම සිය කැමැත්තට අනුව ලබා දී ඇති ආශීර්වාදයන් නියමිත ආකාරයෙන් භාවිත කිරීමට දෙවියන්වහන්සේ අවසර ලබා දී ඇත.. මන්දයත්:
.....ඔබ (අල්ලාහ්) දෙවියන්වහන්සේගේ වරප්‍රසාදයන් ගණනය කිරීමට උත්සාහ කළහොත් ඔබට එය ගණනය කිරීමට නොහැක. නියත වශයෙන්ම අල්ලාහ් ක්ෂමා කරන්නෙකු හා කරුණාවන්තයෙකි”
(අල්-කුර්ආනය 16:18)

## දිව්‍යමය ධර්ම ග්‍රන්ථයන්ගෙන් හා වක්තෘවරුන්ගෙන් ලැබුණු මග පෙන්වීම

“(නබිතුමණි) මෙම ග්‍රන්ථය (වන අල්-කුර්ආනය) ඔහු විසින්ම ඔබට සත්‍යය සමග පහළ කර ඇති අතර එය ඊට පෙර පහළ කරනු ලැබූ දෑයද ස්ථිර කරන්නේය. තවද ඔහුම තව්රාතය හා ඉන්ජීලයද (නබි මූසාට හා නබි ඊසාට පිළිවෙලින් පළමු ධර්මයන් වශයෙන්) පහළ කර ඇත්තේය.”
(අල්-කුර්ආන් 3:3)

මිනිසා නිර්මාණය වූ ද පටන් ඔහුගේ ජීවිතය නිසි ආකාරයෙන් පවත්වාගෙන යන්නේ කෙසේද යැයි පිළිබඳව කිසිඳු අවබෝධයක් නොතිබුණි. දෙවියන්වහන්සේ වක්තෘවරුන්ට හට පහළ කරන ලද මාර්ගෝපදේශයන් මඟින් මිනිසාට තම ජීවිකාව ගෙනයාමට හා තමන්ව රැකබලා ගැනීමට අවශ්‍ය උපදෙස් ලැබුණි.

එම මාර්ගෝපදේශයන් අතුරින් ඉතාමත් ශ්‍රේෂ්ඨ වන්නේ මුහම්මද් නබි තුමාණන්ට පහළ කරන ලද අල්-කුර්ආනයයි.

අල්-කුර්ආනය - අවසාන ධර්මය - වන මෙය පෙර තිබූ ග්‍රන්ථයන් අවලංගු කර දමන ලදී. එය මිනිසාගේ අවසාන මාර්ගෝපදේශයයි. කලින් කලට උචිත ආකාරයට වක්තෘවරුන් මෙළොවට දායාද කළාසේ, දෙවියන්වහන්සේ විසින් පහළ කරන ලද අල්-කුර්ආනයේ ඉගැන්වීම මගින් මිනිසාට තම ජීවිකාව කරගෙන යාමට අවශ්‍ය මාර්ගෝපදේශයන් හා නියමාකාරයේ ප්‍රායෝගික උදාහරණයන් ගෙනහැර දක්වා ඇත. තවද මේ තුළින් තම දෛනික ජීවිතය හැඩගස්වා ගන්නා අන්දම ද පහදා දී ඇත. මෙම නියම උදාහරණය නම් මුළු මහත් මිනිස් වර්ගයාටම වරප්‍රසාදයක් වශයෙන් පහළ කරන ලද මුහම්මද් නබි තුමාණන්ය.

---

“තවද (ඕ මුහම්මද්!) අපි (දෙවියන්) ඔබව මිනිස් වර්ගයාටම දයාවක් බවට මිස, වෙන කිසිවකටත් යැව්වේ නැත.”
(අල්-කුර්ආනය 21:107)

නබි තුමාණන්ගේ දයාව, කරුණාව, ඉවසීම හා අලංකාරවත් ඉගැන්වීම් ආදිය ගෙනහැර දක්වෙන එතුමාණන්ගේ වදන් කිහිපයක් පහත දක්වේ.

- “මෘදුබව (මටසිලිටුබව) සෑම දෙයකටම අලංකාරය එක්කරනු ලැබේ. එහෙත් කිසිම දෙයකට මෘදුබව (මටසිලිටුබව) අඩංගු වී නොමැතිනම් එය අසම්පූර්ණ ක්‍රියාවලියක් වනු නියතයි”.
- “දේව විශ්වාසයේ ඉතාමත් අංග සම්පූර්ණ විශ්වාසවන්තයින් වන්නේ ඔවුන්ගෙන් වූ හොඳ චරිතවත් පුද්ගලයින්ය”.
- “තම අසල්වැසියා කුසගින්නේ පෙළෙන විට තම කුස පුරවා ගන්නා තැනැත්තා අංග සම්පූර්ණ මුස්ලිම්වරයෙකු වන්නේ නැත”.
- “අන් අයට කරුණාව නොදක්වන කෙනාට දෙවියන්වහන්සේ කරුණාව දක්වන්නේ නැත”.

මෙවැනි කාල වකවාණුවක මෙතරම් අලංකාරවත් ඔවදන් අපට කෙතරම් දුරට අවශ්‍ය වනවා නොවෙද?

## තම නිර්මාණයන් කෙරෙහි දක්වන කරුණාව

මිනිසාගේ නිර්මාණය හා ඒවාට ලබා දී ඇති ඉන්ද්‍රියයන්ගේ ක්‍රියාකාරිත්වයම අති විශාල වරප්‍රසාදයක් වෙයි. අපට එදිනෙදා වැඩ කටයුතු කිරීමට හැකි වීම, ආහාර ගැනීම, සෙල්ලම් කිරීම, නින්දට ගොස් අවදිවීම වැනි බොහෝ ද කිරීමට ඇති හැකියාවන්ට අප දෙවියන්වහන්සේට කෙතරම් දුරට කෘතඥ විය යුතුද?

“තවද ඔහුගේ දයාව මගින් එහි ඔබට විවේක ගනු පිණිස ඔහුම ඔබට රාත්‍රියද දහවලද ඔහුගේ වරප්‍රසාදයන් ලබා ගැණීම පිණිස ලබා දී ඇත. එබැවින් (එයට) ඔබ (දෙවියන්ට) කෘතඥ වනු මැනව!” (අල්-කුර්ආනය 28:73)

අඹු සැමි බැඳීම මිනිසාට ලබා දුන් අති මහත් වරප්‍රසාදයකි. එමගින් ජීවිතයට සුන්දරත්වය හා සෙනෙහස ලබා දෙයි.

“තවද ඔහුගේ සළකුණු වලින් ඔහු ඔබ වෙනුවෙන් ඔබගෙන්ම සහකාරියන් නිර්මාණය කර එමගින් ඔබට ඔවුන්ගෙන් ආදරය හා සෙනෙහස ලබා දී ඇති බව දැක ගත හැකිය. ඔහු ඔබ අතරේ ආදරය කරුණාව ඇති කර ඇත්තේය. එබැවින් සිතා වටහා ගත හැකි මිනිසුන්ට නියත වශයෙන්ම මෙහි ඉමහත් සළකුණු ඇත”. (අල්-කුර්ආනය 30:21)

අප මෙළොවට පා තබන්නේ කිසිඳු අකුසල කර්මයකින් තොරවයි. වයසින් මුහුකුරා ගොස් තීරණ ගැනීමට හැකියාව ලබන තුරු අපගේ පින් පව් ගණනය කරනු ලබන්නේ නැත. මෙය ක්‍රිස්තියානු දහමේ “ජන්ම පාපය” යන මතයට හාත්පසින්ම විරුද්ධ වෙයි.

අප කරනා පව් වලට සමාව ලබාදීම දෙවියන්වහන්සේ අප කෙරෙහි පාන දයාව කරුණාව සඳහා වූ තවත් අගනා උදාහරණයකි. ඒ මක්නිසාද යත් අප අතින් වැරදි අඩුපාඩු සිදුවන බව දෙවියන්වහන්සේ හොඳින් දන්නා නිසාය. අප කරනා පාප කර්මයන් නිසා අප කෙරෙහි දක්වන දයාව කරුණාව බිඳකින් හෝ අඩුවේ යැයි සිතීම නොකල යුත්තකි.

“මගේ වහලුනි! තමන් තමන්ගේම ආත්මයන්ට පාපයන් කරගෙන ඇත්තාහ. දෙවියන්වහන්සේගේ (අල්ලාහ්) වරප්‍රසාදයන් ගැන බලාපොරොත්තු සුන් කර නොගනු. අල්ලාහ් සියලු පාපයන්ට සමාව දෙන්නේය. ඔහු ඉමහත් සේ ක්ෂමා කරන්නෙකු හා ඉමහත් කරුණාවන්තයෙකු වන්නේය”.
(අල්-කුර්ආනය 39:53)

සත්වයන්ට පවා දෙවියන්වහන්සේගේ දයාව කරුණාව හිමිවී තිබේ. උන්ට ඇසීම, පෙනීම වැනි ඉන්ද්‍රියන්ගේ ක්‍රියාකාරිත්වයද, ආහාර පාන හා දරුමල්ලන් වැනි බොහෝ ආශීර්වාදයන්ද ලබා දී ඇත. මෙවැනි දේ උන්ට ලබා දී ඇත්තේ දෙවියන්වහන්සේගේ අංශු මාත්‍රයක් හෝ දයාවක් උන් කෙරෙහි ඇති නිසාය.